**අග්නිදිග විශ්වවිද්‍යාලය - 2023**

**-------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

අග්නිදිග විශ්වවිද්‍යාලයේ("විශ්වවිද්‍යාලය") 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ

අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 47 වැනි ඡේදය ප්‍රකාරව සෑම වසර තුනකට හෝ හයකට වරක් දේපළ, පිරියත සහ උපකරණවල සාධාරණ වටිනාකම නැවත තක්සේරු කළ යුතුය. එසේවුවද, මුළු පිරිවැය රු.450,330,000ක්වූ විශ්වවිද්‍යාලයේ ඉඩම් 05ක් 2011 වසරෙන් පසු නැවත තක්සේරු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් දිස්ත්‍රික් තක්සේරුකරුගෙන් ලිපියක් ලැබී ඇති අතර, එම සේවාව සඳහා ගිවිසුම් ප්‍රකාරව ගෙවිය යුතු තක්සේරු ගාස්තුව රු. මිලියන 9.0ක් වන බැවින් දැනට පවතින මූල්‍ය සීමාවන් හේතුවෙන් විශ්වවිද්‍යාලයට එම මුදල ගෙවීමට නොහැකි බව. කෙසේ වෙතත් මෙම කාර්යය නිම කිරීමට අවශ්‍ය මුදල් ඉදිරියේදී වෙන් කිරීමට කටයුතු කරන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ) | මල්වත්ත කෘෂි තාක්ෂණ උද්‍යානයේ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතියේ ඇතුළත් සම්පූර්ණ කරන ලද රු. 8,141,358 ක සංරචකය ප්‍රාග්ධනීත කිරීමට කටයුතු නොකර කෙරීගෙන යන වැඩ යටතේ දක්වා තිබුණි. | ව්‍යාපෘතියේ කොටස් 19 න් සුළු කොටස් 4 ක් පමණක් නිම කර ඇත. මෙම සංරචක වෙන වෙනම ප්‍රාග්ධනීත කිරීම ප්‍රමාණාත්මක නොවේ. ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් අවසන් වූ පසු, සම්පූර්ණ ව්‍යාපෘතියම දේපල, පිරියත සහ උපකරණ යටතේ ප්‍රාග්ධනීත කරනු ලබන බව. | සම්පූර්ණ කරන ලද සංරචක ප්‍රාග්ධනීත කිරීමට පියවර ගත යුතුය. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම.**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්තිය සහ 2019 ජූලි 19 දිනැති අංක 04/2019 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන චක්‍රලේඛයේ 1 වගන්තිය. | මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව ස්ථාවර තැන්පතු යටතේ රු. 124,601,767ක් තැන්පත් කර තිබුණි. | පවත්නා සියලුම ස්ථාවර තැන්පතු සඳහා එකඟතාව ලබා ගැනීම සඳහා දැනටමත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ රේඛීය අමාත්‍යාංශය හරහා භාණ්ඩාගාරයට ලිපියක් යවා ඇත. කෙසේ වෙතත්, අපි තවමත් භාණ්ඩාගාරයෙන් පිළිතුරක් බලාපොරොත්තුවෙන් සිටින බව. | මුදල් පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>------------------- | | | |
| | (i)මුදල් රෙගුලාසි 103(1) | 2023 වසරට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව විශ්වවිද්‍යාලයේ අංශ 18කින් භාණ්ඩ අයිතම 96ක් අස්ථානගත වී තිබුණි. එසේ වුවද මුදල් රෙගුලාසිවලට අනුව අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. | වසර මුලදී ඔලුවිල් විශ්වවිද්‍යාල පරිශ්‍රයේ ඇති වූ ගංවතුර තත්ත්වය හේතුවෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය අවසන් කිරීමට ප්‍රමාද විය. විශ්වවිද්‍යාලයේ සාමාන්‍ය කටයුතු යථා තත්ත්වයට පත් වී සැලකිය යුතු ප්‍රමාදයක් ඇති කරමින් දින කිහිපයකට පසු වත්කම් භෞතිකව සත්‍යාපනය කරන ලද බව. | මුදල් රෙගුලාසිවලට අනුව කටයුතු කළ යුතුය. |
| | (ii) මුදල් රෙගුලාසි 571 | රැඳවුම් මුදල් රු. 17,080,993ක් සහ ආපසු ගෙවිය යුතු තැන්පතු රු. 4,378,800 ක් වසර 03 සිට වසර 09 දක්වා කාලයක් තුළ පියවීමට හෝ රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු නොකර ගිණුම්වල රඳවාගෙන තිබුණි. | වසර දෙකකට වඩා වැඩි කාලයක් තුළ ඉල්ලුම් නොකළ මුදල් ආදායමට ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගනු ලබන බව. | මුදල් රෙගුලාසිවල උපදෙස් පරිදි කාලය ඉකුත්වූ තැන්පතු සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 5.4 වගන්තිය | 2014 වසරේ සිට 2023 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී විශ්වවිද්‍යාලයේ නිල නිවාසවල පදිංචි අධ්‍යයන කාර්ය මණ්ඩලයේ 38 දෙනෙකුගෙන් සහ අනධ්‍යයන කාර්යය මණ්ඩලයේ නිලධාරීන් 02 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 24,924,953 ක මුදල අය කර ගැනීමට විශ්වවිද්‍යාලය කටයුතු කර නොතිබුණි. | විශ්වවිද්‍යාල නිල නිවාස වෙන් කිරීම සහ නඩත්තු කිරීම පාලනය කරන නීතියෙන් දක්වා ඇති පරිදි විශ්වවිද්‍යාල පාලක සභාව විසින් අනුමත කරන ලද ගාස්තු විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩල නිල නිවාසවල පදිංචි කුලී නිවැසියන්ගේ මාසික වැටුපෙන් නිසි පරිදි සහ කඩිනමින් අයකර ගනු ලබන බව. | ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව හිඟ කුලී කුලී නිවැසියන්ගෙන් අයකර ගත යුතුය. |
| (ඈ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ XX පරිච්ඡේදයේ 3 (i)වගන්තිය සහ 2017 ජූලි 10 දිනැති අංක 10/2017 දරන විශ්වවිද්‍යාල කොමිෂන් සභාවේ චක්‍රලේඛ ලිපිය | විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සහ පුස්තකාල කාර්යය මණ්ඩලයේ පැමිණීම හා පිටවීම තහවුරු කර නොගෙන සමාලෝචිත වර්ෂය තුල දී වැටුප් හා දීමනා ලෙස රු. 851,249,018ක් ගෙවා තිබුණි. | සාමාන්‍ය පුරුද්දක් ලෙස, ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය තුළ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැමිණීම සහ පිටවීම පවත්වාගෙන යනු නොලබන බව. | ආයතන සංග්‍රහය හා චක්‍රලේඛ ප්‍රතිපාදන වලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2015 නොවැම්බර් 17 දිනැති අංක 15/2015 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ආයතන චක්‍රලේඛය | 2017/18 සිට 2020/21 දක්වා අධ්‍යයන වර්ෂ සඳහා පීඨ හතරේ පවත්වන ලද විභාගවල ප්‍රතිඵල මාස 4 සිට මාස 7 දක්වා ප්‍රමාදයකින් පසුව නිකුත් කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස සිසුන්ට නියමිත කාලසීමාව තුළ සිය උපාධි පාඨමාලාව සම්පූර්ණ කිරිමට නොහැකි වී තිබුණි. | සමහර අවස්ථාවල විෂය එකක දෙකක ප්‍රතිඵල තරමක් ප්‍රමාද වී ඇත. මෙම ප්‍රමාදයට හේතුව අනෙකුත් විශ්වවිද්‍යාලවල, විශේෂයෙන්ම තාක්ෂණ පීඨයේ සහ කළමනාකරණ සහ වාණිජ පීඨවල විෂයයන් සඳහා දෙවන පරීක්ෂකවරුන් තම ලකුණු පත්‍ර ඉදිරිපත් කිරීමට ප්‍රමාද වී තිබීම බව. එහි ප්‍රතිඵලයක් ලෙස, සියලු ලකුණු ලැබෙන තෙක් අධ්‍යයන වාරයක් සඳහා සාමාර්ථ ලේඛනය අවසන් කිරීමට නොහැකි වීම නිසා ඇතැම් පීඨ සඳහා අධ්‍යයන වාර ප්‍රතිඵල නිකුත් කිරීම ප්‍රමාද වනබව. | චක්‍රලේඛවලට අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | 2014 පෙබරවාරි 11 දිනැති අංක 02/2014 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය | පර්යේෂණ කළමණාකරණ කමිටුවේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව හා කිසිදු අතුරු හෝ අවසාන පර්යේෂණ වාර්තාවක් ලබා නොගෙන 2014 නොවැම්බර් 01 සිට 2023 අගෝස්තු දක්වා කාලපරිච්ඡේදය තුළදී අනධ්‍යාන කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 12 දෙනෙකුට රු.23,008,525ක් පර්යේෂණ දීමනා ලෙස ගෙවා තිබුණි | 2024 වර්ෂයේ සිට ආරම්භ වන සංශෝධිත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 12 වැනි වගන්තියේ පහත ක්‍රියා පටිපාටි දක්වා ඇත. පර්යේෂණය ආරම්භ කළ දින සිට මාස හයක කාලයක් තුළ පර්යේෂණ යෝජනාවේ ක්‍රියාකාරී සැලැස්මට එරෙහිව එහි ප්‍රගතිය ඇතුළත් අතුරු වාර්තාවක් පර්යේෂණ කමිටුවට ඉදිරිපත් කළ යුතුය. පර්යේෂණයේ ප්‍රගතිය අනුව දීමනාව ගෙවීමේ ආරම්භක දිනය කමිටුව විසින් තීරණය කළ යුතුය. පර්යේෂණය සක්‍රීයව පවත්වාගෙන යාමේදී උපරිම වසර තුනක කාලයක් දක්වා පර්යේෂණ දීමනාව ගෙවිය හැකිය. | චක්‍රලේඛයට අනුව කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා මෙහෙයුම් ප්‍රතිඵලය රු. 52,534,712 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 130,456,831 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 77,922,119 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට මුළු ආදායම ඉහළ යාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**2.2 ප්‍රධාන වියදම් අයිතමවල ප්‍රවණතා විශ්ලේෂණය**

සමාලෝචිත වර්ෂය සඳහා ගමන් වියදම්, සැපයුම්, නඩත්තු, කොන්ත්‍රාත් සේවා සහ ස්වයං මූල්‍ය වැඩසටහන් වැනි විශ්වවිද්‍යාල වියදම් පෙර වසරට සාපේක්ෂව සියයට 18 සිට සියයට 64 දක්වා ඉහළ ගොස් තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 දෙසැම්බර් 31 දිනට තනතුරුවලින් ඉවත් වූ නිලධාරීන් 06 දෙනකුගෙන් අයවිය යුතු රු. 1,629,655ක ණය සහ අත්තිකාරම් වසර 02 සිට වසර 23 දක්වා කාලයක් ඉකුත් වී තිබුණද ආපසු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ වන විටත් ආයතන අංශය මගින් අදාළ පිරිස් වෙත ලිපි යවා ඇති අතර ඇතැම් නඩු විභාග වෙමින් පවතින බව. | අදාළ නිලධාරීන්ගෙන් හිඟ ඉතිරි මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) 2023 දෙසැම්බර් 31 දිනට වසර 02 කට වැඩි කාලයක් ගතවී තිබුණද විශ්වවිද්‍යාලයට සේවා සපයන්නන්ට ගෙවිය යුතු රු. 2,145,783 ක මුදල නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ශේෂයන් නිරවුල් කිරීමට සහ වසර දෙකකට වඩා වැඩි කාලයක් හිමිකම් නොලබන නොගෙවූ අරමුදල් විශ්වවිද්‍යාල ආදායමට ගැනීමට අවශ්‍ය පියවර ගනු ලබන බව. | ගෙවිය යුතු හිඟ මුදල් පියවීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) 2009 සිට 2023 දක්වා කාලය තුළ බැඳුම්කර ගිවිසුම් කඩ කළ ආචාර්යවරුන් 07 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 20,687,716 ක මුදල අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | ඔහුගේ/ඇයගේ ඇපකරුවන් වෙත යවන ලද ලිපි මඟින් මාසික වැටුපෙන් වාරික වශයෙන් මුදල් අය කිරීමටත්, අදාළ දේශකවරුන්ගෙන් එනම් ඔහුගේ/ඇයගේ විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලින් සහ විශ්‍රාම වැටුප් ශේෂයෙන් අයකර ගැනීමටත් කටයුතු කරන බව. | අදාළ නිලධාරීන්ගෙන් අයවිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 සිට 2019 දක්වා යාන්ත්‍රික ඉංජිනේරු සහ මෝටර් රථ ඉංජිනේරු සිසුන්ගේ භාවිතය සඳහා විශ්වවිද්‍යාලය විසින් රු. 50,368,729 ක් වටිනා යාන්ත්‍රික උපකරණ අයිතම හතරක් මිලදී ගෙන තිබුණි. කෙසේ වෙතත්, මේවායේ ක්‍රියාකාරීත්වය ප්‍රමාණවත් ලෙස පෙන්නුම් නොකිරීම, නිසි පරිදි සවි නොකිරීම සහ අදාළ අංශ වෙත නිසියාකාරව භාර නොදීම හේතුවෙන් මෙම භාණ්ඩ වසර හතරේ සිට වසර හයකට වැඩි කාලයක් භාවිතයට නොගෙන පැවතුණි. | යන්ත්‍ර දෙකක් දැන් ක්‍රියාකාරී තත්ත්වයේ පවතින අතර 2024 නොවැම්බර් මාසය අවසන් වීමට පෙර භාවිතා කිරීමට ආරම්භ කිරීමට සූදානම් කර ඇති බව .<br>තවත් යන්ත්‍ර දෙකක් ක්‍රියාකාරී තත්ත්වයේ නොපවතින අතර මෙවැනිම අලුත්වැඩියා කිරීම් සහ අමතර කොටස් කිහිපයක් මිලදී ගැනීමට සිදු වී ඇත. 2024 නොවැම්බර් මාසය අවසන් වීමට පෙර ප්‍රායෝගිකව භාවිතා කිරීම ආරම්භ කිරීමට සැලසුම් කර ඇති බව. | නිෂ්ක්‍රීය වත්කම් ඵලදායි ලෙස භාවිත කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඇග්‍රොටෙක් උද්‍යානයේ සැහැල්ලු කණු ඉදිකිරීම සහ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා රු. 14,275,018 ක මුළු පිරිවැයකට කොන්ත්‍රාත්කරුවන් සමඟ විශ්වවිද්‍යාලය විසින් 2021 වර්ෂයේදී ගිවිසුම් දෙකකට අත්සන් කරන ලද අතර 2023 ජූනි මාසය අවසන් කිරීමට නියමිතව තිබුණි. 2023 සැප්තැම්බර් වන විට විශ්වවිද්‍යාලය රු. 69,655,764 (වැට් බද්ද ඇතුළුව)ක් වියදම් | 2024 වර්ෂය සඳහා වෙන්කළ අයවැයෙන් නැවත ටෙන්ඩර් කර අවසන් කිරීමට කටයුතු කර ඇති බව. | අන්‍යෝන්‍ය වශයෙන් අවසන් කිරීමේ ගිවිසුම අත්සන් කර ඉතිරි ඉදිකිරීම් කටයුතු තවදුරටත් ප්‍රමාදයකින් තොරව නිම කිරීමට කටයුතු කළ යුතුය. |

කර තිබියදී කෘෂි තාක්ෂණ පීඨය විසින් ගිවිසුම අන්‍යෝන්‍ය වශයෙන් අවසන් කිරීම නිර්දේශ කිරීම හේතුවෙන් උද්‍යානය අපේක්ෂිත කාර්යය සඳහා යොදා ගැනීමට නොහැකි වීමෙන් දරන ලද වියදම ඵලදායී වී නොතිබුණි.